ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**2023 මාර්තු 03**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන් වෙත**

**පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයන් සඳහා යෝජිත සහන ක්‍රියාමාර්ග**

ස්ථාවර ආදායම් ලබන්නන් හා විශ්‍රාමිකයින් ඇතුළු පුද්ගලයන්ගේ සහ විවිධ ආර්ථික අංශවල නියැලී සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ (මින් ඉදිරියට ණය ගැනුම්කරු ලෙස දක්වා ඇත) ණය ආපසු ගෙවීමේ හැකියාව සහ තිරසාරභාවය, පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ අභියෝගයට ලක්ව ඇත. මෙම අඛණ්ඩ අභියෝගයන්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ) හිඟ ණය සහ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට දැඩි තර්ජනයක් එල්ල කරනු ඇත.

2. ඒ අනුව, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට දැඩි පීඩනයන් ඇති නොවන පරිදි තම ආදායම් මාර්ග පුනර්ජීවනය කිරීමට විභවතාවයක් ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ පුද්ගලයින්ගේ ණය ආපසු ගෙවීම ආරම්භ කිරීම දිරිගැන්වීමේ අරමුණින් පහත සඳහන් දෑ ඇතුළුව සුදුසු සහන ලබා දෙන ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන වෙතින් ඉල්ලා සිටියි.

2.1 පවතින අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් අහිතකර ලෙස බලපානු ලබන සක්‍රිය සහ අක්‍රිය ණය ගැනුම්කරුවන්ගේ ණය පහසුකම්, අනාගත ආපසු ගෙවීමේ හැකියාව /ශක්‍යතාව මත පදනම්ව ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිලේඛනගත කිරීම.

2.2 2020.01.01 දින හෝ ඉන් පසු අක්‍රිය ලෙස වර්ගීකරණය කරන ලද ණය පහසුකම්වලට එරෙහිව ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග, ණය ගනුදෙනුකරු විසින් පිළිගත හැකි ණය ආපසු ගෙවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමේ කොන්දේසිය මත සහ ව්‍යාපාර වල අනාගත ණය ආපසු ගෙවීමේ හැකියාව/ශක්‍යතාව මත පදනම්ව අවස්ථානුකූලව සලකා බලා අත්හිටුවීම.

2.3 සක්‍රිය සහ ප්‍රතිලේඛනගත ණය කලින් පියවීම දිරිමත් කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එම ණය කලින් පියවීමේ දී අය කරනු ලබන ගාස්තු සහ අනාගත පොලී පහත හෙලීම

3. මෙම ලිපියෙන් ඉල්ලා ඇති පරිදි, පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක්ව ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ණය ගැනුම්කරුවන් හට සුදුසු සහන ලබා දීම සඳහා ශාඛාවන් ප්‍රමාණවත් ලෙස පියවර ගන්නා බව සහතික කරන ලෙස සහ මෙම ලිපියේ අන්තර්ගතය ශාඛා ජාලය තුල බෙදා හරින ලෙස ඔබගෙන් ඉල්ලා සිටියි.

**ආචාර්යය පී නන්දලාල් වීරසිංහ**
**අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව**